# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

**අංක 1881 / 33 - 2014 සැප්තැම්බර් 24 වැනි බදාදා - 2014.09.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

**අන්තිම කැමති පත්‍රයක් නොමැති දේපල සඳහා හිමිකම්පෑම් ඉදිරිපත් කරන ලෙස දැන්වීම**

1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත

(55 වන වගන්තිය)

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 34, ඉහළ පෙතියාගොඩ නමැති ගමේ විසූ මියගිය රණවන ගෙදර මුදියන්සේලාගේ ජයන්ති මැණිකේ මහත්මියගේ අන්තිම කැමති පත්‍රයක් නොමැති දේපළ සම්බන්ධවයි.

මියගිය රණවන ගෙදර මුදියන්සේලාගේ ජයන්ති මැණිකේ මහත්මියට අයත් ව තිබුණු හා මෙහි උපලේඛනයේ විස්තර කොට ඇත්තා වූ, අන්තිම කැමති පත්‍රයක් නොමැති දේපළට හිමිකම් කියා සිටින හෝ සම්බන්ධතාවයක් ඇති හෝ නැතැත්තෙකු/ තැනැත්තන් විසින් එකී අන්තිම කැමති පත්‍රයක් නොමැති දේපළට තමාගේ ඇති අයිතිය හෝ සම්බන්ධතාව කවරේදැයි 2014.11.03 දිනට පෙර පහත අත්සන් කරන අය වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ. එසේ කිරීම පැහැර හරිනු ලැබුවහොත්, 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 55 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති යටතේ ඒ දේපළ පිළිබඳ අයිතිය ලියාපදිංචි කිරීමට ඒකපාක්ෂිකව පියවර ගනු ලැබේ.

**ගාමිණී ඉලංගරත්න,**
හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්.

2014 සැප්තැම්බර් මස 17 වැනි දින,
බත්තරමුල්ල,
රජමල්වත්ත පාර,
"මිහිකත මැදුර", අංක 1200/6,
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ දී ය.




*සැ.යු.* - මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**උපලේඛනය**

| *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය* | *ගම* | *කැඩැස්තර සිතියමේ අංකය* | *ඉඩම් කොටසේ අංකය* | *ඉඩමේ ප්‍රමාණය* | *අයිතිය පිළිබඳ සහතිකයේ අංකය* | *ලියාපදිංචි කළ කාර්යාලය* |
|---|---|---|---|---|---|---|
| | | | | *(හෙක්ටයාර්)* | | |
| උඩුනුවර | ඉහළ පෙතියාගොඩ | 320260 | කලාප 04 කැබලි අංක 14 | 0.1391 | 2504729 මහනුවර | මහනුවර |

***සැළකිය යුතුයි.*** - එවැනි අන්තිම කැමති පත්‍රයක් නොමැති දේපළකට හිමිකම් කියා සිටින ලියුම්වල, ඒ දේපළට අදාළ කැඩැස්තර සිතියමේ අංකය, ඉඩම් කොටසේ අංකය සහ ඒ ඉඩමට හිමිකම් පෑමට තමාට ඇති අයිතිය සඳහන් කර තිබිය යුතුය. ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ "අන්තිම කැමති පත්‍රයක් නොමැති දේපළ පිළිබඳ ඉල්ලුම් පත්‍රය" යනුවෙන් ලියා තිබිය යුතු ය.

10 - 403

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි.